ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

**60 | S | I, II**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2014 ජූලි
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
## Genaral Certificate of Education (Ord. Level) Examination, July 2014

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (**x**) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. "විශේෂීකරණය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
1. රටවල් පිහිටි කලාපයට උරුම වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.
2. පුද්ගලයෙකු විසින් තමන්ට වඩාත් කාර්යක්ෂමව සිදුකල හැකි කාර්යෙහි නිරත වීම.
3. රටවල් සුළු ප්‍රමාණයක් පූර්ණ වශයෙන් ස්වයංපෝෂිත වීම සඳහා අවශ්‍ය තරම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
4. කිසියම් කාර්යයක් සඳහා අදාල වන විශේෂ හැකියාවක් හා දක්ෂතාවයක් ඇති ශ්‍රමිකයන්.

02. පොදුවේ පිළිගත් ආකාරයට නිෂ්පාදනය වර්ගීකරණය කරන්න.

| | |
|---|---|
| (A) කෘෂි | (1) ධීවර |
| | (2) පතල් හා කැණීම් |
| (B) කාර්මික | (3) ගෑස්, ජලය |
| | (4) ප්‍රවාහනය |
| (C) සේවා | (5) ගබඩාකරණය |

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.
1. A-1,3 B-2 C-4,5  2. A-1 B-2,3 C-4,5  3. A-1 B-2 C-3,4,5  4. A-1,4 B-2 C-3,5

03. සමන් වී වගාවේ යෙදෙන සාමාන්‍ය ගොවි මහතෙකි. ඔහු මෙම වී අස්වැන්න බෙදාහැරීම සඳහා සුදුසු මාර්ගයක් සොයනු ලබන තැනැත්තෙකි. සමන්ගේ පුත් ටිකිරි තම පියාට බෙදාහැරීමේ මාර්ග 4ක් සිහිපත් කර දුනි. මෙයින් බෙදාහැරීම් මාර්ගයක් නොවනුයේ කුමක් ද?
1. නිෂ්පාදකයා, සිල්ලර වෙළෙන්දා, තොග වෙළෙන්දා, පාරිභෝගිකයා
2. නිෂ්පාදකයා, තොග වෙළෙන්දා, සිල්ලර වෙළෙන්දා, පාරිභෝගිකයා.
3. නිෂ්පාදකයා, සිල්ලර වෙළෙන්දා, පාරිභෝගිකයා
4. නිෂ්පාදකයා, පාරිභෝගිකයා.

04. "අභ්‍යන්තර පරිසර සාධක පදනම් කර ගනිමින් ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිය." ව්‍යාපාරයක ශක්තීන් වන්නේ,
1. අදක්ෂ සේවකයින් සිටීම.  2. දක්ෂ කළමණාකරුවන් නොවීම.
3. දුර්වල මූල්‍ය හැකියාව හා පාලනය  4. හොඳ සැලස්මක් හා දැනුමක් තිබීම.

05. ප්‍රජා පරිසර සාධක ඇතුළත් පිළිතුර කුමක් ද?
1. ස්ත්‍රී පුරුෂ භාවය / වයස් මිශ්‍රණය  2. රැකියා නියුක්තිය/පොළී අනුපාත
3. විශ්වාස / ඇදහිලි  4. රජයේ නීතිරීති/පෞද්ගලිකරණය

06. ශ්‍රී ලංකාවේ වෙළඳ පොළ තුළ පවත්නා මිල උද්ධමන අනුපාතය ක්‍රමයෙන් අඩුවෙමින් පවතිනු දැකිය හැකිය. මෙහි සඳහන් මිල උද්ධමනය අයත්වන පරිසර සාධකය කුමක් ද?
1. සංස්කෘතික පරිසරය  2. දේශපාලන පරිසරය  3. ආර්ථික පරිසරය  4. තාක්ෂණික පරිසරය

07. ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී ඉලක්ක පාරිභෝගික සංඛ්‍යාව අයත් වන්නේ,
1. මූල්‍ය සැලැස්මෙහි ය.  2. අලෙවි සැලැස්මෙහි ය.
3. මානව සම්පත් සැලැස්මෙහි ය.  4. මෙහෙයුම් සැලැස්මෙහි ය.

08. පහත දැක්වෙන දෑ අතුරින් උපකාරක සේවාවක් නොවන්නේ,
1. වෙළෙඳාම  2. සන්නිවේදනය  3. බැංකු කටයුතු  4. ගබඩාකරණය

09. පුද්ගලයෙකු රක්‍ෂණ ආවරණයක් ලබා ගැනීම මගින්
1. අවදානම වෙනත් පාර්ශවයකට පවරනු ලබයි.
2. අනතුරක් පිළිබඳ අවදානම අඩුකර ගනී.
3. ප්‍රධාන හානි ඇතිවීමේ නිශ්චිත හැකියාව අඩු කර ගනී.
4. අනාගත අවදානම් අඩු කර ගනී.

10. හානිපූර්ණ මූලධර්මයට අදාල නොවන්නේ,
1. ගිනි රක්‍ෂණය 2. රථ වාහන රක්‍ෂණය
3. කෘෂි රක්‍ෂණය 4. පෞද්ගලික අනතුරු රක්‍ෂණය

11. චෙක්පත් රේඛණය අවලංගු කළ හැකි පුද්ගලයා
1. අණකරු 2. ආදායකයා 3. වාණිජ බැංකුව 4. පැවරුම්ලාභියා

12. පහත සඳහන් දෑ අතරින් වාණිජ බැංකුවක කාර්යයක් නොවන්නේ කුමක් ද?
1. ගනුදෙනුකරුවන්ගේ යම් ප්‍රකාශිත නියෝග ඇතොත් ඒවා ඉෂ්ට කිරීම.
2. ගනුදෙනුකරුවන්ගේ චෙක්පත් හට ගරු කිරීම.
3. ගනුදෙනුකරුවන්ගේ කටයුතු සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීම.
4. අදාල කාල සීමාවේ දී හෝ ගනුදනුකරුවන්ගේ ඉල්ලීම මත ඔවුන්ට ගිණුම් ප්‍රකාශ ලබා දීම.

13. පහත දැක්වෙන දෑ අතුරෙන් හවුල් ව්‍යාපාර වල හා තේවල ස්වාමි ව්‍යාපාර වල දැකිය හැකි පොදු ලක්‍ෂණය වන්නේ,
1. ව්‍යාපාර ණය සඳහා අයිතිකරුවන් පෞද්ගලික බැඳීම
2. අවදානම බෙදා හැරීම.
3. ලියාපදිංචිය අනිවාර්ය වීම
4 වෙනම නෛතික ඒකකයක් ලෙස සැලකීම.

14. වණික් බැංකු, කල්බදු සමාගගම්, මුදල් තැරැව්කාර ආයතන මෙම ආයතන 3 හැඳින්විය හැකි නම
1. වාණිජ බැංකු 2. සංවර්ධන බැංකු
3. තැන්පතු භාර නොගන්නා ආයතන 4. මූල්‍ය ආයතන

15. ප්‍රවාහනයේ මූලිකාංග

| | |
|---|---|
| (A) මාධ්‍ය | (1) විදුලිය, ගෑස් |
| (B) මාර්ගය | (2) බස් නැවතුම, වරාය |
| (C) බලය | (3) ලොරි, බෝට්ටු |
| (D) පර්යන්තය | (4) මහ මාර්ග, ජල මාර්ග |

1. A-4, B-2, C-1, D-3 2. A-3, B-4, C-2, D-1 3. A-3, B-4, C-1, D-2 4. A4, B-3, C-1, D-2

16. සුදත් මහජන බැංකුවේ ගිණුමක් විවෘත කර තිබුණි. කළුතරදී සුදත්ගේ පෞද්ගලික අවශ්‍යතාවක් මත රු. 1,000ක් ලබා ගැනීමට අවශ්‍ය විය. මහජන බැංකුවක් සොයා ගැනීමට තව 5Km පමණ දුරක් සුදත්ට යන්නට තිබුණි. එනිසා සුදත් ලගම ඇති ලංකා බැංකු ශාඛාවකින් තමන්ට අවශ්‍ය මුදල ලබා ගන්නට විය. සුදත් පරිභෝජනය කෙරුණු බැංකු අතර පවත්නා මේ විශේෂ සේවාව කුමක් ද?
1. අන්තර් බැංකුකරණය 2. ඒකීය බැංකුකරණය
3. දුරකතන බැංකුකරණය 4. අන්තර්ජාල බැංකුකරණය

17. සී/ස අක්වෙරළ සමාගම, සී/ස පෞද්ගලික සමාගම, සී/ස පොදු සමාගම මෙම සමාගම් 3 අයත් වන සමාගම් වර්ගය කුමක් ද?
1. සී/ර සමාගම් 2. ඇපයෙන් සීමිත සමාගම්
3. ලැයිස්තුගත සමාගම් 4. කොටසින් සීමිත සමාගම්

18. ව්‍යාපාර ලියාපදිංචි කළ පමණින්ම සෑම ව්‍යාපාරයකටම හිමි නොවන වරප්‍රසාදය වන්නේ,
1. ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම. 2. ව්‍යාපාරයේ හිමිකාරීත්වය තහවුරු වීම.
3. ණය ලබා ගැනීමේ කටයුතු පහසුවීම. 4. නීතිමය පුද්ගලභාවයක් හිමිවීම.

19. ඉතිරිකිරීමේ බැංකුවක මූලික අරමුණ වන්නේ,
1. ව්‍යාපාරිකයින්ට මුහුණ දීමට සිදුවන ගැටලුවලට උපදෙස් සැපයීම ය.
2. ජංගම ගිණුම් හා අනෙකුත් ගිණුම් වර්ග පවත්වා ගනිමින් ව්‍යාපාර කටයුතු වලට සේවා සැපයීම ය.
3. ජනතාව ඉතිරිකිරීමට පොළඹවමින් දේශීය ඉතුරුම් මට්ටම ඉහල නැංවීම ය.
4. ආර්ථික සංවර්ධනය ඇතිකරලීමට ආයෝජකයින්ට ණය මුදල් සම්පාදනය කිරීම ය.

20. ලලිත් අන්තර් ජාලය මගින් ඇනවුම් කොට ඔහුගේ ව්‍යාපාරයට අවශ්‍ය යන්ත්‍ර ජපානයේ සිට ගෙන්වා ඇත. මෙය හදුන්වන්නේ,
1. අන්තර්ජාල භාවිතය ලෙස ය. 2. විද්‍යුත් වාණිජ්‍ය ලෙසය ය.
3. විද්‍යුත් කළමණාකරණය ලෙස ය. 4. විද්‍යුත් ව්‍යාපාර ලෙස ය.

21. වත්කමක ලක්‍ෂණයක් නොවන්නේ,
1. පිරිවැය විශ්වාසවන්ත ලෙස මැනිය නොහැකි වීම.
2. අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ලබා දීම
3. ව්‍යාපාරය පාලනයට යටත් වීම.
4. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.

22. අයේෂ් 2014.01.01 දින තමන්ගේ ලී බඩු ව්‍යාපාරයක් මොරටුවේ දි ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපාරයට පරිභෝජනය සඳහා රු. 500,000 ක ලී භාණ්ඩ සිරි සුමන ව්‍යාපාරයෙන් මිලදී ගෙන තිබුණි. අයේෂ් ව්‍යාපාරයේ ගිණුම් පිලියෙල කරන පුද්ගලයා මෙම ද්විත්ව සටහන තිබු ආකාර පහත දැක්වේ. මෙයින් නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

| | | | |
|---|---|---|---|
| 1. | ගැණුම් ගිණුම | හර | රු. 500,000 |
| | මුදල් ගිණුම | බැර | රු. 500,000 |
| 2. | ලී බඩු ගිණුම | හර | රු. 500,000 |
| | මුදල් ගිණුම | බැර | රු. 500,000 |
| 3. | ගැණුම් ගිණුම | හර | රු. 500,000 |
| | සිරි සුමන ගිණුම (ණයහිමි) | බැර | රු. 500,000 |
| 4. | ලී බඩු ගිණුම | හර | රු. 500,000 |
| | සිරි සුමන ගිණුම (ණයහිමි) | බැර | රු. 500,000 |

23. කසුන් තමන්ගේ වාණිජ ප්‍රශ්ණ පත්‍රයට ලියු පිළිතුරු සමුහයක් පහත දැක්වේ.

| | **උපයෝගි පොත** | **මුලාශ්‍ර ලියවිලි** |
|---|---|---|
| 1. | ආපසු යැවුම් ජ'නලය | බැර පත |
| 2. | ආපසු එවුම් ජ'නලය | හර පත |
| 3. | විකුණුම් ජ'නලය | විකුණුම් ඉන්වොයිසිය. |
| 4. | පොදු ජ'නලය | ජ'නල් වවුචරය |
| 5. | මුදල් පොත - ගෙවීම් | ගෙවීම් වවුචරය |
| 6. | ගැණුම් ජ'නලය | ඉන්වොයිසිය. |

නිවැරදිව ලියා ඇති අයිතම් කාණ්ඩය තෝරන්න.

1. 1 හා 2 2. 1, 2 හා 5 3. 3, 4 හා 5 4. 1, 2, හා 6

24. 2013.12.31 දිනට එක්තරා ව්‍යාපාරයක වත්කම් වගකීම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| මෝටර් රථය | 350,000 | ඉඩම් | 530.000 |
| භාණ්ඩ තොගය | 50,000 | ගෘහ භාණ්ඩ | 30,000 |
| සිරිසෝම - ණයහිමි | 50,000 | බැංකු ණය | 30.000 |
| ණයගැතියෝ | 270.000 | | |

2014.01.01 දින ව්‍යාපාරය රු. 300,000 නව මෝටර් රථයක් ණයට මිලදී ගන්නා ලදී. 2014.01.01 දිනට ව්‍යාපාරයේ ප්‍රාග්ධනය කොපමණ ද?

1. රු. 1,150,000 2. රු. 1,250,000
3. රු. 650,000 4 කිව නොහැක.

25. දුනිදුගේ ව්‍යාපාරයේ 2013 දෙසැම්බර් මාසයේ සුළු මුදල් ප්‍රතිපූර්ණය කල මුදල රු. 767කි. 2013 දෙසැම්බර් මාසයේ අත ඉතිරි වු සුළු මුදල් අගය වනුයේ රු. 233 කි. 2014 පෙබරවාරි මාසයේ සුළු මුදල් ආරම්භක ශේෂය වනුයේ රු. 330 කි. 2014 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම් වල අගය කියද?

1. රු. 767.00 2. රු. 670.00 3. රු. 233.00 4. 1.000.00

26. වීරසේකරගේ ව්‍යාපාරයේ 2014.12.31 දිනට,

වත්කම් වල ශුද්ධ අඩුවීම රු. 70,000
වගකීම් වල ශුද්ධ වැඩිවීම රු. 30.000

ප්‍රාග්ධනයේ ශුද්ධ අඩුවීම හෝ වැඩිවීම කීයද?

1. ශුද්ධ වැඩිවීම රු. 100.000 2. ශුද්ධ වැඩිවීම රු. 40,000
4. ශුද්ධ අඩුවීම රු. 100,000 4. ඉහත කිසිවක් නැත.

27. පහත සඳහන් ඒවා අතුරෙන් පොදු ජ'නලයේ සටහන් නොකරනු ලබන්නේ,

1. වැරදි නිවැරදි කිරීම්
2. ගැලපුම් සඳහා සටහන්
3. ස්ථාවර වත්කම් ණයට ගැනීම
4. නැවත විකිණීම සඳහා භාණ්ඩ මිලට ගැනීම.

28. සමන් මෝටර් රථ විකිණීම සඳහා ව්‍යාපාරයක් ආරම්භ කර අත. ඔහු පරිභෝජනය සඳහා ඉන්දු මෝටර්ස් වෙතින් මෝටර් රථයක් ලබා ගන්නා ලදී. සමන් මෙම ගනුදෙනුව සටහන් තබන උපයෝගි පොත කුමක් ද?

1. ගැනුම් ජ'නලය 2. පොදු ජ'නලය
3. මුදල් පොත 4. ඉහත කිසිවක් නොවේ

29. පහත ඒවා අතුරෙන් ව්‍යාපාරයක වියදම් වැඩිවීමට තුඩු දෙන ගනුදෙනුව වන්නේ,

1. බැංකු ණය ආපසු ගෙවීම. 2. වැටුප් ගෙවීම
3. ණයහිමියෙකුට ගෙවීම. 4. ඉඩමක් මිලදී ගැනීම.

30. පොදුකාර්ය පිරිවැයට උදාහරණ ලෙස පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් සැලකිය හැකිද?

1. නිෂ්පාදන කිරීමට ගන්නා අමුද්‍රව්‍ය 2. නිෂ්පාදන කළමණාකරුගේ වැටුප
3. ගෙන ඒමේ කුලි 4. කිසිවක් නොවේ.

31. සුමනසිරි සපත්තු ව්‍යාපාරිකයෙකි. ඔහු සපත්තු යුගල 1000 ක් නිෂ්පාදනය කිරීමට නිෂ්පාදන පිරිවැය ලෙස රු. 350,000ක වියදමක් දැරිය. එක් සපත්තු යුගලක් සඳහා පිරිවැය මත 15% ක ලාභයක් තබා විකුණන්නේ නම් සපත්තු යුගලක විකුණුම් මිල කියද?

1. රු. 350.00
2. රු. 385.00
3. රු. 402.50
4. කිසිවක් නොවේ.

32. නිෂ්පාදන සමාගමක පොත් වලින් 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දැක්වෙන වියදම් ඔබ විසින් උපුටා ගෙන ඇත.

A - අමුද්‍රව්‍ය මිලට ගැනීම රු. මිලියන 10
B - යන්ත්‍ර ක්ෂය රු. 50,000
C - කම්හල් වැටුප් රු. මිලියන 1.5

ඉහත සඳහන් වියදම් වලට අනුව වඩාත් යෝග්‍ය වර්ගීකරණ වන්නේ,

| | **ප්‍රාථමික පිරිවැය** | **පොදුකාර්ය පිරිවැය** | **පරිපාලක වියදම්** |
|---|---|---|---|
| 1. | A හා B | - | C |
| 2. | A | C | B |
| 3. | A | B හා C | - |
| 4. | - | A හා C | B |

33. බැංකු සැසඳුම් ප්‍රකාශයක දැකිය නොහැකි අයිතමය වන්නේ,

1. අගරු චෙක්පත්
2. බැංකුවේ වැරදි
3. තැන්පත් කළමුත් උපලබ්ධි නොවූ චෙක්
4. නිකුත්කළ මුත් ඉදිරිපත් නොවූ චෙක්පත්

34. මුදල් පොත සංශෝධනය කිරීමේ දී මුදල් පොතට හර කළ යුතු අයිතමය වන්නේ.

1. බැංකුවට ලැබී ඇති ලාභාංශ
2. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති ණය වාරිකය
3. ණයහිමියන්ට නිකුත් කරන ලද චෙක්පත්
4. බැංකුව අය කළ ගාස්තු

35. ගිණුම්කරණයේ ඒකක සංකල්පය වඩාත් හොඳින් විස්තර කරනුයේ,

1. හිමිකරු ගිණුම්කරණ ක්‍රියාවලිය සඳහා සහභාගි වීම මගිනි.
2. හිමිකරුගේ පෞද්ගලික ණය ව්‍යාපාරයේ පොත්වල සටහන් කරනු ලැබීම මගිනි.
3. ව්‍යාපාරය අයිතිකරුගෙන් වෙන් වූ ඒකකයක් ලෙස හඳුනා ගැනීමෙනි.
4. හිමිකරුගේ නම ව්‍යාපාරයේ නාමය ලෙස යොදා ගැනීම.

36. මුදල් පොතේ බැංකු අයිරාව සටහන් කරන්නේ,

1. මුදල් තීරුව බැරට ය.
2. බැංකු තීරුව හරට ය.
3. මුදල් තීරුව හරට ය.
4. බැංකු තීරුව බැරට ය.

37. වගකීම් වලට පමණක් බලපාන ගනුදෙනුව වන්නේ,

1. ස්ථාවර වත්කම් මිලට ගැනීම.
2. ණයගැතියන්ගෙන් මුදල් ලැබීම.
3. බැංකුවෙන් ණයට ගෙන පියල්ගේ ණය පියවීම.
4. ගොඩනැගිලි අළුත් වැඩියා කටයුතු සඳහා වියදම් දැරීම.

38. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. දුන් වට්ටම් ගිණුම් ගත කරයි, ලද වට්ටම් ගිණුම් ගත කරයි. වෙළෙඳ වට්ටම් ගිණුම් ගත කරයි.
2. දුන් වට්ටම් ගිණුම් ගත නොකරයි, ලද වට්ටම් ගිණුම් ගත කරයි. වෙළෙඳ වට්ටම් ගිණුම් ගත කරයි.
3. දුන් වට්ටම් ගිණුම් ගත කරයි, ලද වට්ටම් ගිණුම් ගත කරයි. වෙළෙඳ වට්ටම් ගිණුම් ගත නොකරයි.
4. කිසිදු වට්ටමක් ගිණුම්ගත වන්නේ නැත.

39. සුගත් තම අභිමතය පරිදි ව්‍යාපාරයක් ආරම්භ කළ අතර කෙටි කාලයකින් එම ව්‍යාපාරය අසාර්ථක විය. අසාර්ථක වීමට හේතු සෙවීමේ දී ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ,

1. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැති වීමයි.
2. හිතවත් අය ව්‍යාපාරයට සම්බන්ධ කර නොගැනීම යි.
3. දුර්වල කළමණාකරණය
4. නිවැරදි ව්‍යාපාර සැළැස්මක් නොමැතිව කටයුතු කිරීම.

40. කුමාරි, තාරක ව්‍යාපාරයට බඳවා ගත් නවක ලිපිකාරිණියකි. ඇය ත්‍රිත්ව තීරු මුදල් පොතේ තීරු තුනම තුලනය කර තිබුනි. මෙය දුටු ගණකාධිකාරිවරයා වට්ටම් තීරුව තුලනය නොකරන ලෙසට ඇයට දැනුම් දෙන ලදි. එයට හේතුව වුයේ,

1. මුදල් වට්ටම් පමණක් සටහන් කර ඇති නිසා ය.
2. වෙළෙඳ වට්ටම් පමණක් සටහන් කර ඇති නිසා ය.
3. මුදල් වට්ටම් හා වෙළෙඳ වට්ටම් දෙකම සටහන් කර ඇති නිසා ය.
4. වට්ටම් තීරු සිහිවටන තීරු ලෙස පවත්වාගෙන යන නිසා ය.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.